# 10 ශ්‍රේණිය - පළමු වාරය, පැවරුම 2, 2020

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1. අප විසින් සකස් කරනු ලැබූ දත්ත යම් අර්ථාන්විත ආකාරයකින් දැක්වීම,

   i. තොරතුරකි
   ii. පද්ධතියකි
   iii. තාක්ෂණයයි
   iv. තොරතුරු හා තාක්ෂණයයි

2. ජාතික හැඳුනුම්පතෙහි 3න් වන අංකයෙන් හඳුනාගත හැකි වන්නේ

   i. උපන් දිනය
   ii. පිරිමි/ගැහැණු
   iii. උපන් අවුරුද්ද
   iv. පද්ධති අංකය

3. කිසියම් භාණ්ඩයක තොරතුරු අදාළ වෙබ් අඩවියෙන් ලබා ගැනීම සඳහා ............ භාවිත කරයි.

   i. Decording
   ii. QR  Code
   iii. Smart Phone
   iv. photo

4. තොරතුරක ලක්ෂණයක් නොවන්නේ,

   i. (කාලීනබව)Timeliness
   ii. (තත්වය)Quality
   iii. (නිවැරදි බව)Accuracy.
   iv. සම්පූර්ණබව)completeness

5.ශ්‍රී ලංකා රාජ්‍ය වෙබ් අඩවියක් නොවන්නේ,

   i. ICTA
   ii. Government information center
   iii. www.moe.gov.lk
   iv. www.msn.com

6. අධ්‍යාපනික වෙබ් අඩවියක් වන්නේ

   i. www.gooogle.com
   ii. www.twitter.com
   iii. www.e-thaksalawa.moe.gov.lk
   iv. www.facebook.com

7.ආදාන උපාංග පමණක් ඇතුලත් වන්නේ,

   i. Touch screen, printer, web camera
   ii. Touch screen, microphone ,joystick
   iii. Printer, light pen, keyboard
   iv. Light pen, keyboard ,monitor

8.මධ්‍ය සැකසුම් ඒකකයෙහි කොටසක් වන්නේ

   i. (පඨන මාත්‍ර මතකය)Read Only Memory
   ii. Basic Input Output system
   iii. (පාලන ඒකකය)Control Unit
   iv. (විශ්ව ශ්‍රේණි බසය)Universal Serial Bus

9. USB කෙවෙනිය සම්බන්ධ වාසියක් නොවන්නේ,

i. සම්බන්ධ කිරීම පහසු වේ.
ii. ඇතුලත් කිරීමට විශේෂ මෘදුකාංග අවශ්‍ය නොවේ.
iii. විවිධ උපාංග සවි කල හැක.
iv. අමතර විදුලිය සපයා දිය යුතුය

10. ECG යන්ත්‍රයෙහි භාවිත කරනු ලබන තාක්ෂණය වන්නේ,

i. සංඛ්‍යාංක(Digital)
ii. මිශ්‍ර(Hybrid)
iii. (ප්‍රතිසම)Analog
iv. (සුපිරි)Super

11.බ්ලු රේ තැටියක ධාරිතාව ඇතුලත් පරාසය වන්නේ ,

i. 47GB - 90GB
ii. 650MB - 900 MB
iii. 25GB - 128GB
iv. 16GB - 120GB

12. ලේසර් මුද්‍රණ යන්ත්‍රය සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ

i. වර්ණ සහිත මුද්‍රණ යන්ත්‍ර ලබා ගත නොකිය.
ii. පිටපත් ඉතා පැහැදිලිය
iii. කාට්‍රිජ භාවිත කරයි
iv. මුද්‍රණ යන්ත්‍රමිල අධික වේ.

13. පහත ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය වන්නේ,

i. දත්ත හා උපදෙස් ඇතුලත් කිරීමට ආදාන උපාංග යොදා ගනියි.
ii. තිරයේ ඇති මෙනුවෙන් තෝරා ගැනීමට ආලෝක පෑන භාවිත කරයි.
iii. ද්විතියික ගබඩා කිරීමේ උපාංග වල දත්ත ස්ථිරවම ගබඩා කල හැක.
iv. පාලන ඒකකය විසින් පාලන සංඥා යවනු ලබන්නේ ආදාන ඒකකයට පමණි.

14. දෙවන පරම්පරාවේ භාවිත කල තාක්ෂණය වන්නේ,

i. ට්‍රාන්සිස්ටර්(Transistors)
ii. චුම්බක මාධ්‍ය(Magnetic media)
iii. අනුකලිත පරිපථ(Integrated circuits)
iv. රික්තක නළ(Vacuum Tubes)

15. උසස් මට්ටමේ පරිගණක භාෂා භාවිත වුයේ,

i. First Generation
ii. Second Generation
iii. Third Generation
iv. Fourth Generation

16.Wi-Fi සඳහා යොදා ගන්නා මාධ්‍ය වන්නේ,

i. ගුවන් විදුලි තරංග(Radio Waves)
ii. ක්ෂුද්‍ර තරංග(Micro waves)
iii. ප්‍රකාශ තන්තු(Fiber optics)
iv. අධෝරක්ත කිරණ(Infrared)

17. ද්විතියික ගබඩා කිරීමේ උපාංග පමණක් ඇතුලත් වන්නේ

i. RAM ,ROM ,Flash Memory
ii. ROM ,Compact Disk ,DVD
iii. Compact Disk ,DVD ,Blue-Ray disk
iv. RAM ,Compact Disk ,Magnetic tape

18. පරිගණක ජාලයක ඇති පරිගණක එම ජාලයට හා ජාල ස්විචයට සම්බන්ධ කිරීම සඳහා යොදා ගනු ලබන කෙවෙනිය වන්නේ,

i. PS2 port
ii. RJ 45 port
iii. USB port
iv. HDMI port

19. පරිගණකයක වේගය මැනීම සෘජුවම බලපානු ලබන්නේ ,

i. රෙජිස්තර(Registers)
ii. දෘඩ තැටිය (Hard Disk)
iii. පඨන මාත්‍ර මතකය(ROM)
iv. මධ්‍ය සැකසුම් ඒකකය (Central Processing Unit)

20. පහත ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය වන්නේ,

i. ප්‍රකාශ තන්තු කේබල මිල අධික වේ.
ii. සමාක්ෂ කේබල රූපවාහිනී යන්ත්‍රවල ඇන්ටනා වයර සඳහා යොදා ගනියි
iii. වැසුණු ඇඹරූ කම්බි යුගල වයර ආරක්ෂාකාරී මාධ්‍යක් නොවේ.
iv. රූපවාහිනී යන්ත්‍රවල දුරස්ථ පාලක සඳහා අධෝරක්ත කිරණ භාවිත වේ.